EDCS

ආරම්භය: 1930 ලියා. අංකය: 736
ஆரம்பம்: 1930 பதிவு இல: 736
Inception: 1930 Reg. No: 736

# සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය

# තනතුරු පුරප්පාඩු

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතු වූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමුපකාර සමිතියකි.

මෙම සමිතියේ පුරප්පාඩු වී ඇති නීති විමර්ශන නිලධාරී, පුහුණු කිරීමේ නිලධාරි, කාර්මික නිලධාරි, කාර්මික ශිල්පී, කාර්යාල කාර්ය සහයක, කම්කරු හා රියදුරු යන තනතුරු සඳහා කුසලතා පූර්ණ උද්යෝගිමත් සහ කැපවීමෙන් යුතුව වැඩ කිරීමේ හැකියාව ඇති අදාළ සුදුසුකම් සැපිරූ අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නීති හා විමර්ශන නිලධාරී - E.3.2.1 (විධායක ශ්‍රේණිය III වන පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01 - ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම්**

- නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම සමඟ නීති ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්ද ලබා තිබීම

**හෝ**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය විෂයක් ලෙස ඇතුළත් උපාධිය සමග සමුපකාර ක්ෂේත්‍රයේ නීති කටයුතු පිළිබඳව වසර 5 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** 29,900-475X10-500X10-39,650

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## පුහුණු කිරීමේ නිලධාරී - E.3.2.1 (විධායක ශ්‍රේණිය III වන පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01 - ප්‍රධාන කාර්යාලය**

- පිළිගත් විශ්වවිද්‍යාලයක මානව සම්පත් / කළමනාකරණය / සමාජ විද්‍යා යන ක්ෂේත්‍රයේ උපාධියක් සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

**හෝ**

- පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද

**හෝ**

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන උසස් පෙළ සමග පිළිගත් වාණිජ / කාර්මික පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය:** මාසික 29,900-475X10-500X10-39,650/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## කාර්මික නිලධාරී - E.3.3 (විධායක ශ්‍රේණිය III වන පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01 - ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම්**

ජාතික ආධුනිකත්ව මණ්ඩලය / කාර්මික විද්‍යාලය / රජය පිළිගත් විද්‍යාලයක කාර්මික ශිල්පය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කිරීම හා පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :** මාසික 28,700-425X10-450X10-37,450/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ, සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ

## කාර්මික ශිල්පී - 0.1 (මෙහෙයුම් ශ්‍රේණිය III වන පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව - 02 - ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම්**

- ජාතික ආධුනිකත්ව මණ්ඩලය / කාර්මික විද්‍යාලය / රජයේ පිළිගත් විද්‍යාලයක කාර්මික ශිල්පය පිළිබඳ ක්ෂේත්‍රයට අදාළ සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කිරීම හා පිළිගත් ආයතනයක කාර්මික ශිල්පී තනතුරේ වසරක පළපුරුද්ද

**හෝ**

- අ.පො.ස. උසස් පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයක කාර්මික ශිල්පී තනතුරේ වසර 2 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :** මාසික 21,700-250X10-275X10-26,950/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## කාර්යාල කාර්ය සහයක - S.1.1 (සහාය ශ්‍රේණිය-තෘතීයික මට්ටම - II පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව -11**

**සුදුසුකම්**

- දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ භාෂාවට සාමාර්ථ සමඟ අ.පො.ස.සා/පෙළ විෂයයන් 06 කින් සමත්වීම

**වැටුප් පරිමාණය :** මාසික 18,600 190X 10-200X10 - 22,500/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## කම්කරු -S.2.1 (සහාය ශ්‍රේණිය- ද්විතීයික මට්ටම II වන පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව - 24**

**සුදුසුකම්**

- 8 ශ්‍රේණිය සමත්වීම.

**වැටුප් පරිමාණය :** මාසික 18,000-170X10-185X10-21,550/-

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ, සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## රියදුරු - S.1. (සහාය ශ්‍රේණිය - තෘතීයික මට්ටම - II වන පන්තිය)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01 - ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම්**

අ.පො.ස. සා/පෙළ විෂයන් 6 කින් සමත්වීම සමඟ වසර 03 ක් පැරණි බර වාහන රියදුරු බලපත්‍රය සහිතව රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** මාසික 18,600-190X10-200X10-22,500/=

ඉහත මාසික වැටුපට අමතරව රු.17,800/- ක ජීවන වියදම් දීමනාව සහ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත දීමනා හිමි වේ.

## පොදු කොන්දේසි

- අයදුම්කරුවන් වයස අවු.18 ත් 45 ත් අතර විය යුතුය.
- ජීවදත්ත සහිත සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද ඇතුළත්ව තමා විසින්ම සකස් කළ අයදුම්පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතු අතර, දැනටමත් ඔබ සමුපකාර සමිතියක සේවය කරයි නම් අදාළ අයදුම් පත්‍රය එම සමුපකාර සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය.
- මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත වන අතර, තෝරාගනු ලබන අයගේ වැටුපෙන් 10% ක්ද, ආයතනයෙන් 15% ක්ද සමඟ සේවක අර්ථසාධක අරමුදලට බැරකරනු ඇත.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
- කාර්යාල කාර්ය සහයක හා කම්කරු යන තනතුරු සඳහා තෝරා ගනු ලබන අය සමිතියේ ඕනෑම දිස්ත්‍රික් කාර්යාලයක සේවය කිරීම සඳහා එකඟ විය යුතුය.
- තමාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද දක්වෙන සහතිකවල පිටපත්ද, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ පිටපතක්ද සමඟ අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2024-03-28 දින දහවල් 12.00ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.


**ප්‍රධාන සභාපති**
**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර, කොළඹ 03.**
**දුරකථන අංකය : 011 2370717 ෆැක්ස් : 0112577475**